# රට රකින
# රට හදන
## ජනතාවාදී පාලනයක් සඳහා
## විද්වත් පෙළගැස්ම

National Intellectuals Organization
ජාතික විද්වත් සංවිධානය தேசிய புத்திஜீவிகள் அமைப்பு

**වසර හැත්තෑ එකක දේශපාලන ඉතිහාසය විසින් අපට උරුම කරදී ඇති සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ක්ෂේත්‍රයන් පිළිබඳව ශ්‍රී ලාංකේය ජාතිය ලෙස අපට සතුටු විය හැකි නොවේ. මෙම සමාජීය පරිහානිය පිළිබඳව පොදු ජනතාවගේ ඇතුළු සමාජයේ සියලු කොටස්වලට ඇත්තේ බරපතල විවේචනයකි. එසේම මෙම කඩාවැටීමට වගකිව යුතු දේශපාලන පක්ෂවල ඇතමුන් පවා මෙම සමාජීය අර්බුදකාරී තත්වයට තම පක්ෂවල වගකීම පිළිගනිමින් සිටිති.**

**කෙසේ වුවද මෙම සමාජීය අර්බුදකාරී තත්වය පිළිබඳව බොහෝ දෙනෙකු තුළ විවේචනයක් පැවතියද කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව සාමූහික එකඟතාවයක් නැත.**

ගෙවී ගිය දශක කිහිපය තුළ රටේ ආර්ථිකය කළමනාකරණය කළ සියලු ආණ්ඩු නිෂ්පාදන ආර්ථියක් දිශාවට රට යොමු කරමින් ඒ සඳහා පදනම සකස් කරනු වෙනුවට නව ලිබරල් ආර්ථික ක්‍රමයක් කෙරෙහි විශ්වාසය තබමින් ඒ ඔස්සේ කටයුතු කිරීම නිසා ට්‍රිලියන 11කට ආසන්න ඉසිලිය නොහැකි විදේශීය ණය උගුලක සිර වී ආර්ථිකය දිනෙන් දින කඩා වැටෙමින් පවතින බව දැන් අපට නොරහසකි. රටේ දළ ජාතික ආදායමෙන් 95.4% ක් ලබාගත් විදේශීය ණය වශයෙන් ගෙවීමට ඇති රටක් බවට මේ වන විට ශ්‍රී ලංකාව පත්ව තිබීමෙන් මෙම ඛේදවාචකයේ බරපතළකම මැනවින් නිරූපණය වේ. 2016 විගණන වාර්තාව අනුව ලබාගෙන ඇති සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 11ට ආසන්න වුවද වත්කම් වශයෙන් පවතින්නේ රුපියල් ට්‍රිලියන 1.1ක් බව තහවුරුවී තිබීම පමණක් වුවද මෙම ආර්ථික අර්බුදයේ දිග පළල හා ගැඹුර අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත්ය. මෙබඳු ආර්ථිකයක් සහිත රාජ්‍යයක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම කෙලෙසකින් හෝ සිදුවිය නොහැක්කකි. තව දුරටත් අපි විසඳුම් සොයන්නේ මෙම විෂමචක්‍රය තුළින්ම නම් යහපත් ආර්ථික වර්ධනයක් සහිත රාජ්‍යයක් බවට පත්වීම සිහිනයක් පමණක්ම වනු ඇත.

> ශ්‍රී ලංකාවේ ධනවත් 20%ක් සමස්ත ගෘහස්ථ ආදායමෙන් 50% ට වඩා පරිභෝජනය කරද්දී දුප්පත් 20% සඳහා ලැබෙන්නේ එයින් 5% ක් පමණි. දුප්පත්ම 10% (මාසික ආදායම රු 19,720ට වඩා අඩු) පරිභෝජනය කරනු ලබන්නේ සමස්ත ගෘහස්ථ ආදායමෙන් 1.8% ටත් වඩා අඩු ප්‍රතිශතයකි. කොළඹ දිස්ත්‍රික්කයේ මාසික ආදායම රු. 81,372 හෝ ඊට වඩා වැඩි ප්‍රතිශතය 72.9% වෙද්දී මුලතිව් දිස්ත්‍රික්කයේ මාසික ආදායම රු. 36,500ට වඩා අඩු ප්‍රතිශතය 71.6%කි.

මෙම තත්වය නිසා පුරවැසියා මත අධික බදුබර පැටවීමත්, ඔවුන්ගේ ජීවන තත්වය පහළ වැටීමත්, සුභසාධන ක්‍රියාවලිය අකර්මණ්‍යවීමත් අනිවාර්යයෙන්ම සිදු වේ. එය වළක්වාලීමට කිසිදු විද්‍යාත්මක වැඩපිළිවෙළක්, එනම් නිෂ්පාදන ආර්ථිකයක් කරා යොමුවීමත්, කුසලතා පූර්ණ මානව සම්පතක් නිර්මාණය කර ගැනීමත් පදනම් වූ ක්‍රියාවලියක් රාජ්‍ය මට්ටමින් ආරම්භ කිරීමත් තබා ඒ සඳහා අවශ්‍ය

> ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලියෙන් පිටමං වන ප්‍රතිශතය ඉතා ඉහළ අගයකි. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත් වන ප්‍රතිශතය 97% වුවද පස්වන වසර සඳහා ඇතුළත් වන්නේ 94ක් පමණි. 10 වසර දක්වා අධ්‍යාපනය ලබන්නේ 87%ක් පමණක් වන අතර අ.පො.ස. (සා.පෙ.) සමත්ව උසස් පෙළ අධ්‍යාපනය සඳහා පිවිසෙන්නේ 51%ක් පමණි. එයිනුත් විශ්වවිද්‍යාල සඳහා වරම් ලබා ගනුයේ 3%ක් පමණි. එහිදී විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීම සඳහා සුදුසුකම් ලබන අයගෙන් 17%පමණක් විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමට වරම් ලැබීම කැපී පෙනේ. ද්විතීයික අධ්‍යාපනයේ යෙදෙන දරුවකුට මාසිකව අවම වශයෙන් රු 12,930ක් පෞද්ගලික පංතිවලට සහ පොතපත් සඳහා වැය කිරීමට සිදුවේ. මාසික ආදායම රු.19,720ට වඩා අඩු 10%ක් වන පවුල්වලට මෙය කිසිසේත් දරාගත නොහැක.

සංවාදයක් ගොඩනැගීම හෝ සිදු වන බවක් දක්නට නොමැති වීම මෙම බේදවාචකය වඩාත් තීව්‍ර කරන්නකි.

මෙම ආර්ථික පරිහානියට සමගාමීව සමාජ දේශපාලන ක්ෂේත්‍රයේ නිර්මාණය වී ඇති ව්‍යාකූල තත්ත්වයද අනොන්‍ය වශයෙන් බද්ධ වී ශ්‍රී ලංකාව, ලෝකය ඉදිරියේ අන්ත දීන තත්වයකට පත් කර තිබේ. සාමූහිකත්වය මගින් ජයග්‍රහණ ලබන ජන විඥානයක් වෙනුවට ආර්ථික අර්බුදය විසින් සමාජය පොළඹවනු ලබන්නේ පුද්ගල කේන්ද්‍රකරගත් හඹා යාම මගින් ජයග්‍රහණ ලබා ගැනීම කෙරෙහිය. එය පවුල් සංස්ථාව තුළ සිදුවන බිඳවැටීම්වල සිට ගෝත්‍රවාදී මතවාද පෝෂණය කරමින් බරපතළ සමාජ ව්‍යවසනයක් නිර්මාණය වීමට පසුබිම සාදන තත්වයන් දක්වා වර්ධනය වී ඇත. අම්පාර හා දිගන ප්‍රදේශවලදී දක්නට ලැබුණේ එම වැඩවසම් හා ගෝත්‍රවාදී මනෝභාවයේ ප්‍රකාශනයකි.

පිරිහීගිය දේශපාලන සදාචාරය ශ්‍රී ලාංකේය සමාජය මුහුණ දෙන බරපතළ ගැටලුවක් වී තිබේ. දේශපාලනය යනු පරාර්ථකාමී, උත්තුංග, මානුෂීය පදනමක පිහිටා ක්‍රියාත්මක විය යුතු තත්වයකි. ඒ වෙනුවට හුදු ආත්මාර්ථය පෙරදැරි කරගත් නිර්ලජ්ජිත ධනෝපායන මාර්ගයක් පමණක් බවට දේශපාලනය පත් කර ගැනීමට බොහෝ දේශපාලඥයින් කටයුතු කිරීම සාමාන්‍යකරණය වී ඇත. විශිෂ්ට දේශපාලන පරමාදර්ශ උපහාසයකට ලක් කෙරෙන අතර එය ප්‍රවාදයක් පමණක් ලෙස සැලකීමට සමාජයට බලකෙරී ඇත. වඩාත් කණගාටුදායක තත්වය වන්නේ සමාජයීය පුරවැසියන් මෙම වටපිටාව උකටලී ලෙස පිළිගෙන කටයුතු කිරීමට සූදානම් වීමයි.

> නිදහස් සෞඛ්‍යයක් පවත්වාගෙන යාම පිළිබඳ අපි ඉහළින් කතා කළද ඒ සඳහා යන වියදමින් රජය දරන්නේ 61.57%ක් පමණි. අනෙක් 38.43% මහජනතාවට සිය පුද්ගලික වියදමින් දැරීමට සිදු වී ඇත. කිසියම් හෝ සෞඛ්‍ය ආවරණයක් පවතින්නේ ජනගහනයෙන් 4%කට පමණි. දළ ජාතික ආදායමෙන් 1.7-2.0% පමණක් සෞඛ්‍යය සඳහා වියදම් කිරීම නිසා ඖෂධ හා විශේෂඥ උපදෙස් සඳහා සිය ආදායමෙන් අතිවිශාල කොටසක් වෙන් කිරීමට මහජනතාවට සිදුවේ.

සංස්කෘතික හා සදාචාර පරිහානිය මෙරට සමාජය ගිලගෙන පවතින තවත් ව්‍යවසනයකි. සාරධර්ම, සංස්කෘතික වටිනාකම් ආත්මීය ගුණගරුකභාවය පිළිබඳ සංකල්ප ඇතුළු සියලු සමාජ හරපද්ධති අභාවයට යමින් පවතී. ආචාරධාර්මික සංස්කෘතික මිනිසා වෙනුවට අශීලාචාරත්වය ඉවසන සහ එය උත්කර්ෂණය කරන හුදකලා මිනිස් රූපකයන් තව තවත් බිහිවෙමින් පවතී. එබදු වටපිටාවක අතිශය විනාශකාරී මත්ද්‍රව්‍ය උවදුර වැනි උවදුරු සමාජයම ගිලගනිමින් පවතී. මෙසේ මෙරට ආර්ථික, සමාජ, දේශපාලන ඇතුළු සියලු කේෂේත්‍රවල ඇති වී තිබෙන බරපතළ පරිහානිය හා මෙම අර්බුදයේ ගැඹුර පිළිබඳව අප බොහෝ දෙනෙකුට විවේචනයක් පවතින බවත් එය වෙනස්වීමේ අවශ්‍යතාවය අවබෝධ කරගෙන සිටින බවත් පැහැදිලි කරුණකි.

ජාතික විද්වත් සංවිධානය (National Intellectuals Organization - NIO) මෙම සියලු තත්වයන් සැලකිල්ලට ගනිමින් දිගු කලක් තිස්සේ බොහෝ සවිඥානික පුරවැසියන් හා කණ්ඩායම් පවත්වාගෙන ගිය සංවාදයක ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය. එම පිරිස් සමාජය ආචාරධාර්මිකව වෙනස් කිරීම සඳහා කේන්ද්‍රීය මැදිහත් කිරීමට සමත් සමාජ සංවිධානයක අවශ්‍යතාව අවධාරණය කළ අතර මෙම කණ්ඩායම් ඒ සඳහා දැක්මක් ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීමටත් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් සමාජ දේශපාලන ව්‍යාපාරයක් බවට පත් කිරීමටත් දරන ලද ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස NIO බිහි විය.

## ජාතික විද්වත් සංවිධානය ආරම්භය

රටෙහි සමාජ දේශපාලන ආර්ථික ව්‍යුහයන්හි තීරණාත්මක වෙනසක් වෙනුවෙන් කටයුතු කිරීම සියලු සමාජ පුරවැසියන්ගේ වගකීමක් වුවද ඒ සඳහා ක්‍රියාකාරීව මැදිහත් වන පිරිස සාපේක්ෂව විශාල නොවේ. සමාජයේ විවිධ ස්ථර නියෝජනය කරන විවිධ වෘත්තීන්වල නියැලී සිටින පුද්ගලයින් සිය හැකියාවේ සහ සමාජ සම්බන්ධතාවයන්ට ගැලපෙන පරිදි එම කර්තව්‍යයට දායකවීම බොහෝ කලක සිට අපට අසන්නට දකින්නට ලැබේ. ඒ සඳහා සමහර සමාජ කොටස් විවිධ දේශපාලන පක්ෂ සංවිධාන

හරහා ක්‍රියාත්මක වෙද්දී තවත් සමාජ කොටස් විවිධ සමාජ ව්‍යාපාරයන් ලෙස කටයුතු කරනු දක්නට ලැබේ. සිය විශ්වවිද්‍යාල ජීවිතයේ, වෘත්තීය ජීවිතයේ හා සමාජ ක්‍රියාකාරිත්වය තුළ දැන හඳුනාගත් ප්‍රගතිශීලී පුද්ගලයන් එවැනි කණ්ඩායම්වලට ඒකරාශී වෙමින් කටයුතු කිරීම පිළිබඳව අපට ඇත්තේ වසර ගණනාවක අත්දැකීමකි. ජාතික විද්වත් සංවිධානය එවන් සංවිධාන හා පුද්ගලයින්ගේ වසර ගණනාවක ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. සිය ක්ෂේත්‍රයන්ට අනුගතව සමාජ ක්‍රියාකාරිත්වයේ නියලුන සංවිධාන ගණනාවක් ජාතික විද්වත් සංවිධානය ආරම්භ කිරීමෙහි පුරෝගාමී මෙහෙවරක් ඉටු කළේය.

ජනතා ආර්ථික පදනම, ජීවයේ අයිතිය, සමාජ සමානාත්මතාව උදෙසා විශ්වවිද්‍යාල ආචාර්යවරු, ජාතික මාධ්‍ය සංසදය, ජනතා මෙහෙවර සදහා වූ රාජ්‍ය සේවකයෝ ආදී විවිධ සංවිධානවල සාමාජිකයන් හා ක්‍රියාධරයන් එක් සංධිස්ථානයකදී තීරණයකට එළඹුණේ වෙන් වෙන්ව සිය ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වනවා වෙනුවට සමස්ත සමාජයම යහපත් දිශාවකට වෙනස් කිරීම අරමුණ කරගත් පුළුල් සමාජ සංවිධානයක් බිහි කිරීමකින් තොරව සිය අරමුණ සාක්ෂාත් කරගත නොහැකි බවටය. ඒ අනුව ඉහත සංවිධානවල සාමාජිකයෝ සහ යහපත් සමාජ ක්‍රමයක් වෙනුවෙන් කටයුතු කිරීමට කැමැති සමාජ බුද්ධිමත්හු සිවිල් ක්‍රියාකාරිකයෝ  සහ දේශපාලන ක්‍රියාධරයෝ එක්ව සිට ජාතික විද්වත් සංවිධානය බිහිකිරීමට කටයුතු කළෝය. උසස් සාමූහික මානව ක්‍රියාකාරිත්වයකින් සන්නද්ධ ආචාරධාර්මික සමාජයක් ඇති කිරීමට නම් ඒ සදහා දියුණු දැක්මක්, ඒ දැක්ම මත ගොඩ නැගුණු ජාතික ප්‍රතිපත්තියක් සහ එම ජාතික ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු බව අවබෝධ කරගත් ඉහත සංවිධාන එකමුතුව ඒ සඳහා නවමු ප්‍රවේශයක් ලබා ගන්නා අරමුණෙන් සිට ජාතික විද්වත් සංවිධානය ලෙස කටයුතු කිරීම ආරම්භ කෙරුණි.

## ජාතික විද්වත් සංවිධානයේ වැඩපිළිවෙළ සහ ඉදිරිමඟ

ජාතික විද්වත් සංවිධානයේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකේය සමාජය යහපත් ලෙස වෙනස් කිරීමයි. වෙන් වෙන්ව හුදෙකලා ජයග්‍රහණ වෙනුවෙන් හඹායන පුද්ගලයන් සහිත සමාජයක් වෙනුවට උසස් සාමූහික මානව ක්‍රියාකාරිත්වයක් සහිත ආචාරධාර්මික සමාජයක් බිහි කිරීමයි. ඒ සදහා දියුණු සංස්කෘතික පුරවැසියන් බිහි කරන සමාජීය වටපිටාවක් අත්‍යවශ්‍ය වේ. එවන් සමාජ වෙනසක් ඇති කරලීම සඳහා කේන්ද්‍රීය මැදිහත්වීමක් සිදු කිරීමටත් එම වෙනස සිදු කළ යුතු සහ සිදු කළ හැකි බව මහජනයාට අවබෝධ කරදී පුරවැසි වගකීම ඉටු කරලීම සදහා මහජන ක්‍රියාකාරිත්වයකට නායකත්වය සැපයීම ජාතික විද්වත් සංවිධානයේ වගකීම බව අපගේ විශ්වාසයයි. එම යුතුකම හා වගකීම ඉටුකරලීම සඳහා මේ වන විට ජාතික විද්වත් සංවිධානය විවිධ සමාජ ක්‍රියාකාරකම්වල නියැළෙමින් සිටී. රට හදන රට දිනන ජාතික ප්‍රතිපත්ති සෑදීමේ වැඩපිළිවෙළ හා එම ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන පුළුල් මහජන ව්‍යාපාරයක් ගොඩනැංවීම සඳහා කේන්ද්‍රීය දායකත්වය සැපයීමත් ඒ අතරින් ප්‍රධානත්වය ගනී.

## ජාතික ප්‍රතිපත්ති සැකසීම

සමාජය වෙනස් කරලීමට නම් ඒ සදහා වන පුළුල් දැක්මක්, ඒ දැක්ම මත සැකසුණු ප්‍රතිපත්ති මාලාවක් සහ එම ප්‍රතිපත්තිමාලාව ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකාව වෙනස් කරලීම සදහා අත්‍යවශ්‍යයෙන්ම වෙනස් කළ යුතු වැදගත් ක්ෂේත්‍ර 10ක් හඳුනාගත් සාධක විද්වත් සංවිධානය එම ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සදහා ඒ ඒ ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ට, ප්‍රාමාණික බුද්ධිමතුන්ට, සිවිල් වෘත්තීය සමිති ක්‍රියාකාරීන්ට සහ දේශපාලන ක්‍රියාධරයන්ට ආරාධනා කරන ලදී. මේ ආරාධනාව පිළිගත් වෛද්‍යවරු, නීතිඥයින් විශ්වවිද්‍යාල ආචාර්යවරු රාජ්‍ය සේවයේ විශ්‍රාමික නිලධාරීහු ප්‍රවීන සාහිත්‍යධරයෝ හා කලාකරුවෝ තාක්ෂණවේදීහු පරිසර ක්‍රියාකාරිකයන් ඇතුළුව සමාජයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වත් වෘත්තිකයෝ පහත දැක්වෙන කමිටුවලට අනුගත වෙමින් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කරමින් සිටී.

### කෘෂිකර්මය/ධීවර හා පශු සම්පත් ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ  අංශ ප්‍රධානි
    මහාචාර්ය එල්.එම්. අබේවික්‍රම මහතා

02. කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ හිටපු ලේකම් තිස්ස වර්ණසූරිය මහතා
03. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් පශු වෛද්‍ය කුමාර ද සිල්වා මහතා
04. බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ආචාර්ය සුමිත් අබේසිරිවර්ධන මහතා
05. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් කමල් මාන්කෝට්ටේ මහතා
06. රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යාපීඨයේ හිටපු මහාචාර්ය අශෝක ගුණවර්ධන මහතා
07. බතලගොඩ වී පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂක ආචාර්ය එම්.පී. ධනපාල මහතා
08. පොල් සංවර්ධන මණ්ඩලයේ හිටපු සභාපති ආචාර්ය පරාක්‍රම වෛද්‍යානාථ මහතා
09. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අනුරුද්ධ කරුණාතිලක මහතා
10. Hayleys Agriculture Holdings Limitedහි සාමාන්‍යාධිකාරී සෙනරත් කිරිවත්තුඩුව මහතා
11. සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් කරුණාරත්න මහතා
12. සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ලේකම් ටී.බී. සරත් මහතා
13. ජලජීවී සංවර්ධන අධිකාරියේ හිටපු ජලජීවී වගා ව්‍යාප්ති නිලධාරී ප්‍රේමසිරි ජාසිංආරච්චි මහතා
14. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ හිටපු අධ්‍යක්ෂ ආර්.ඩී. සිරිපාල මහතා
15. පශු වෛද්‍ය පුබුදු සමරවීර මහතා
16. OPEX AGRI පෞද්ගලික සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හේමජීව ගෝධාභය මහතා
17. සියනෑ හෝල්ඩින් ආයතනයේ සහකාර සාමාන්‍යාධිකාරී ටිකිරි රාමනායක මහතා

## කලා හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

1. සාහිත්‍යවේදී පූජ්‍ය බටුවන්ගල රාහුල හිමි
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය, සාහිත්‍යවේදී ලියනගේ අමරකීර්ති මහතා
3. සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ හිටපු ලේකම් ඒ.පී.ඒ. ගුණසේකර මහතා
4. සාහිත්‍යවේදී කීර්ති වැලිසරගේ මහතා
5. සාහිත්‍යවේදී කමල් පෙරේරා මහතා
6. කිවියර නන්දන වීරසිංහ මහතා
7. සාහිත්‍යවේදී බුද්ධදාස ගලප්පත්ති මහතා
8. රංගන ශිල්පිනී දීපානි සිල්වා මෙනෙවිය
9. සංගීතවේදී විශ්වනාදන් සදානන්දන් මහතා
10. ගිරාගම ගුරු විද්‍යාලයේ හිටපු විදුහල්පති, කථිකාචාර්ය චිත්‍ර ශිල්පි චාල්ස් දයානන්ද මහතා
11. ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල් කාන්ත මහතා
12. සාහිත්‍යවේදිනී ශාන්ති දිසානායක මහත්මිය
13. කැළණිය විශ්වවිද්‍යාලයේ ලලිතකලා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා
14. සබරගමුව විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි මහතා
15. මාධ්‍යවේදී, කිවියර කපිල එම්. ගමගේ මහතා
16. කැළණිය විශ්වවිද්‍යලයේ නාට්‍ය රංග කලා හා ප්‍රතිබිම්බ කලා අධ්‍යයන අංශයේ ඒකක ප්‍රධානී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රංගන ශිල්පී ප්‍රියංකර රත්නායක මහතා
17. චිත්‍රපට අධ්‍යක්ෂ සෙනේෂ් දිසානායක බණ්ඩාර මහතා

18. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රංගන ශිල්පි ප්‍රසන්නජිත් අබේසූරිය මහතා
19. කිවියර නිලාර් එම්. කාසිම් මහතා
20. චිත්‍රපට අධ්‍යක්ෂ අනුරුද්ධ ජයසිංහ මහතා
21. ටෙලි නාට්‍ය අධ්‍යක්ෂ සහ රංගන ශිල්පී නාමල් ජයසිංහ මහතා
22. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අසේල රංගදේව මහතා
23. සංගීතවේදී නදීක ගුරුගේ මහතා
24. චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රියන්ත කළුආරච්චි මහතා
25. සාහිත්‍යවේදී කෞශල්‍ය කුමාරසිංහ මහතා
26. සිනමාවේදී ධනුෂ්ක ගුණතිලක මහතා
27. සංගීතවේදී සුදන්ත මාධව මහතා
28. රංගන ශිල්පී ජගත් මනුවර්ණ මහතා
29. නාට්‍යවේදී ප්‍රේමරත්න තෙන්නකෝන් මහතා

## ආර්ථික ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අනිල් ජයන්ත මහතා
02. කැළණිය විශ්වවිද්‍යාලයේ වානිජ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
03. ආර්ථික විශ්ලේෂක ගාමිණී වරුෂමාන මහතා
04. රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ ආචාර්ය ඉන්දික ප්‍රසන්න මහතා
05. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දයානන්ද අම්බලන්ගොඩගේ මහතා
06. රුහුණු විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශාන්ත සුමනරත්න මහතා
07. පාර්ලිමේන්තුවේ කෝප් කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතා
08. අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති, වසන්ත සමරසිංහ මහතා
09. වරලත් ප්‍රමාණ සමීක්ෂක සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රමෝපායන් පිළිබඳ විශේෂඥ, රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය චන්දන ජයලත් මහතා
10. ලංකා ටයිල්ස්, කළමනාකරණ අධ්‍යක්ෂ මහේන්ද්‍ර ජයසේකර මහතා
11. අනුරාධ සෙරමික් ප්‍රයිවට් ලිමිටඩ් සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ අජිත් පෙරේරා මහතා
12. ව්‍යාපාරික එස්.එම්.ඩී. සූරිය කුමාර් මහතා
13. කැලණි සියැට් ටයර් කර්මාන්ත ආයතනයේ සාමාන්‍යාධිකාරී තුෂාර හෙට්ටිතන්ත්‍රි මහතා
14. මාධව පලිහපිටිය මහතා - Associate Director, Massachusetts office of public collaboration, lecturer, McCormack graduate school of policy and global studies, university of Massachusetts Boston USA

## අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු නියෝජ්‍ය උපකුලපති හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ පශ්චාත් උපාධි සහ පර්යේෂණ අධ්‍යයන පීඨයේ පීඨාධිපති මහාචාර්ය රාහුල අතලගේ මහතා

02. ඇමරිකාවේ සෑම් හූස්ටන් විශ්වවිද්‍යාලයේ සංඛ්‍යානය පිළිබඳ මහාචාර්ය ආනන්ද බන්දුලසිරි මහතා
03. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය එස්.බී. හෙට්ටිආරච්චි මහතා
04. රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය පී.ඒ. ජයන්ත මහතා
05. රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ රසායනික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ජිනසේන හේවගේ මහතා
06. සියනෑ අධ්‍යාපන විද්‍යා පීඨයයේ හිටපු පීඨාධිපති සුනන්ද වර්ණකුලසූරිය මහතා
07. අග්නිදිග විශ්වවිද්‍යාලයේ ලේකඛාධිකාරී අබ්දුල් සතාර් මහතා
08. අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත විෂය පිළිබඳව හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂක විජයදාස හේවාවිතාරණ මහතා
09. පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක මහතා
10. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දේශපාලනය හා ජාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අතුලසිරි සමරකෝන්
11. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විජේන්ද්‍ර බණ්ඩාර මහතා
12. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා
13. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය
14. ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ මහතා
15. කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා අධ්‍යයන අංශයේ ආචාර්ය ප්‍රභා මනුරත්න මහත්මිය
16. රංගන ලක්මාල් දේවප්‍රිය මහතා
17. කැලණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ජේ.ආර්.පී. ජයකොඩි මහතා
18. රුහුණු විශ්වවිද්‍යාලයේ ගණිත අධ්‍යයන අංශයේ ආචාර්ය අජිත් රවීන්ද්‍ර ද මෙල් මහතා
19. කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය කපිල සෙනෙවිරත්න මහතා

## පරිසරය ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

1. පරිසරවේදී පූජ්‍ය වෑකන්දවල රාහුල හිමි
2. පරිසරවේදී ආචාර්ය එස්.ඩී. ගොඩිගමුව මහතා
3. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ භෞතික විද්‍යා මහාචාර්ය, භූ විද්‍යාඥ රොහාන් ප්‍රනාන්දු මහතා
4. ආචාර්ය අශෝක රංවල මහතා
5. රුහුණු විශ්වවිද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ඩී.එල්.ඒ.එච්. ශම්මික ලියනගේ මහතා
6. ජ්‍යෙෂ්ඨ පරිසරවේදී ආචාර්ය රවීන්ද්‍ර කාරියවසම් මහතා
7. ජ්‍යෙෂ්ඨ පරිසරවේදී, ලේඛක සම්පත් ආරියසේන මහතා
8. විදුහල්පති එන්. විජයකුමාරන් මහතා
9. ජීවයේ අයිතිය කැඳවුම්කරු සහ බහු විනාශකාරී උමා ඔය ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණේ කැඳවුම්කරු සමන්ත විද්‍යාරත්න මහතා
10. රුහුණු විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රේමදාස ලියනාරච්චි මහතා
11. පරිසරවේදී, වාස්තු විද්‍යාඥ උදුල බණ්ඩාර ඖෂධහාමි මහතා
12. කැලණි ගං දියවර සුරැකීමේ ජාතික ව්‍යාපාරයේ සභාපති අසිත නිරෝෂන් මහතා

13. පරිසරවේදී එස්. කුමුදු ගුණවර්ධන මහතා
14. භූ විද්‍යාඥ ඇන්ටන් ජයකොඩි මහතා

## සෞඛ්‍ය ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ මහජන සෞඛ්‍ය අංශයේ මහාචාර්ය, ප්‍රජා වෛද්‍ය විශේෂඥ ක්‍රිෂාන්ත අබේසේන මහතා
02. සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු අධ්‍යක්ෂක (සැලසුම්), ප්‍රජා දන්ත වෛද්‍ය විශේෂඥ සමන්ත විමලරත්න මහතා
03. සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු අධ්‍යක්ෂක, ඒඩ්ස් සහ ලිංගාශ්‍රිත රෝග මර්දන අංශයේ හිටපු අධ්‍යක්ෂක වෛද්‍ය නිමල් එදිරිසිංහ මහතා
04. බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු හෙද අධ්‍යක්ෂිකා, පේරාදෙණිය සහ කොළඹ විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනී කේ. දිසානායක මහත්මිය
05. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ කේ.ජී.පී. බණ්ඩාර මහතා
06. බදුල්ල හිටපු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී පී.ආර්. ශාන්තලාල් මහතා
07. සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ ලෝක සෞඛ්‍ය සංවිධානයේ හිටපු කලාපීය උපදේශක, ප්‍රජා වෛද්‍ය විශේෂඥ නිහාල් අබේසිංහ මහතා
08. පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා
09. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මහාචාර්ය එම්.එම්.ඒ. තිසේරා මහතා
10. හෘද රෝග විශේෂඥ වෛද්‍ය නාමල් විජේසිංහ මහතා
11. මහා බ්‍රිතාන්‍ය එසෙක්ස් බැසිල්ටන් විශ්ව විද්‍යාල පර්යේෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය ඉඳුනිල් විජේනායක මහතා
12. රජරට විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යසාධන බලකායේ සාමාජික වෛද්‍ය මනෝජ් ප්‍රනාන්දු මහතා
13. කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ දේශීය චිකිත්සා අධ්‍යයන අංශ ප්‍රධානී විශේෂඥ වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන් මහතා
14. රුහුණු විශ්වවිද්‍යාලයේ කරාපිටිය වෛද්‍ය පීඨයේ අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන විශේෂඥ වෛද්‍ය ක්ලිෆර්ඩ් පෙරේරා මහතා
15. ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය උදය කුමාරප්පෙරුම මහතා
16. ශෛල්‍ය වෛද්‍ය විශේෂඥ රනිල් ජයසේන මහතා
17. සමස්ත ලංකා හෙද සංගමයේ සභාපති හෙද නිලධාරී එස්.බී. මැදිවත්ත මහතා
18. වෛද්‍ය අසංග වික්‍රමසිංහ මහතා
19. වකුගඩු සුරැකීමේ ජනතා ව්‍යාපාරයේ සභාපති සහ අනුරාධපුර ශික්ෂණ රෝහලේ වකුගඩු නිවාරණ ඒකකයේ වෛද්‍ය සුසිල් රණසිංහ මහතා

## ශ්‍රී ලාංකික ජාතිය ගොඩනැගීමේ ප්‍රතිපත්ති සම්පාදක කමිටුව

01. රාමඤ්ඤ නිකායේ අධිකරණ ලේඛකාධිකාරී, ජාතික භික්ෂු පෙරමුණේ ප්‍රධාන අනුශාසක මහාචාර්ය අත්තන්ගනේ රතනපාල හිමි
02. හිටපු අමාත්‍යාංශ ලේකම් සහ සීමානීර්ණය අභියාචනා කමිටු සභාපති අශෝක පීරිස් මහතා (ප්‍රතිපත්ති සම්පාදන කමිටුවේ සභාපති)
03. වව්නියාව හිටපු මහ දිසාපති තිල්ලේ නඩරාසා මහතා
04. නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම් ඒ.සී.එම්. රාසික් මහතා
05. නීතිඥ උපුල් කුමාරප්පෙරුම මහතා
06. කැලණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්.ජේ. යෝගරාජා මහතා
07. යාපනය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය සමිනාදන් විමල් මහතා

08. කැළණිය විශ්වවිද්‍යාලයේ ක්‍රිස්ත්‍රියානි සංස්කෘතිය පිළිබඳ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විජිත් රෝහන ප්‍රනාන්දු මහතා
09. කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජයී විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය චන්දන අබේරත්න මහතා
10. පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා
11. රුහුණු විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්ය සරෝජා පෝල්රාජ් මහත්මිය
12. රාමලිංගම් චන්ද්‍රසේකරන් මහතා
13. රුහුණු විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දේවා මයිකල් ද සිල්වා මහතා
14. කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පාරා හමීඩ් මහත්මිය
15. නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
16. අශෝක් ස්ටීවන් පියතුමා, සමාජය හා සාමූහික කේන්ද්‍රය
17. මහාචාර්ය එස්. බාලසුන්දරම් පිල්ලේ

## ක්‍රීඩා ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. ක්‍රීඩා විද්‍යායතනයේ හිටපු අධ්‍යක්ෂක ජනරාල් හා කැළණිය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යයන අංශයේ බාහිර කථිකාචාර්ය මහාචාර්ය බී.එල්.එච්. පෙරේරා මහතා
02. ශ්‍රී ලංකා පාපැදි සම්මේලනයේ සභාපති හා ජාත්‍යන්තර පාපැදි තරඟ විනිසුරු එන්. කරුණාරත්න මහතා
03. ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමයේ විධායක කමිටු සාමාජික හා මළල ක්‍රීඩා ජාතික තේරුම් කමිටුවේ හිටපු සභාපති සමන් කුමාර ගුණවර්ධන මහතා
04. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායමේ හිටපු ජ්‍යෙෂ්ඨ ක්‍රීඩක ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ මහතා
05. ජාතික මළල ක්‍රීඩා සංගමයේ සභාපති හා මළල ක්‍රීඩාශූර සුගත් තිලකරත්න මහතා
06. මීටර් 400 කඩුලු පැනීමේ ඉසව්වේ ජාතික ශූර රොහාන් ප්‍රදීප් කුමාර මහතා
07. කොළඹ ආනන්ද විද්‍යාලයේ ප්‍රධාන අත්පන්දු පුහුණුකරු ඩී.එස්. වසන්ත කුමාර මහතා
08. පාසැල් ක්‍රීඩා පුහුණු ගුරු මුදිතා ලියනපතිරණ මහත්මිය
09. සමස්ත ලංකා කබඩි සම්මේලනයේ හිටපු උප සභාපති, ජාතික කබඩි කණ්ඩායමේ පුහුණුකරු අමිල උදයකාන්ත ලක්ප්‍රිය මහතා

## ප්‍රවාහන ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති අචාර්ය උපාලි පන්නිලගේ මහතා
02. හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරි ප්‍රියාල් සිල්වා මහතා
03. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අචාර්ය ප්‍රීමාල් ප්‍රනාන්දු මහතා
04. මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ අංශයේ ආචාර්ය මහින්ද බණ්ඩාර මහතා
05. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ හිටපු අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රවී ද මෙල් මහතා
06. සමස්ත ලංකා දුම්රිය සේවකයන්ගේ පොදු සේවක සංගමයේ ලේකම් එස්.පී. විතානගේ මහතා
07. සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම් සේපාල ලියනගේ මහතා
08. පළාත් සභා මන්ත්‍රී නලින් හේවගේ මහතා
09. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අචාර්ය දිලීප විතාරණ මහතා

10. මොරටුව විශ්වවිද්‍යාලයේ සමෝධානික නිර්මාණ අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිතුමිණ රත්නමලල මහතා

## තොරතුරු තාක්ෂණය (IT) ප්‍රතිපත්ති සම්පාදන කමිටුව

01. Indika Gamage - Senior software Engineer and consulting architect, President at Sri Lanka Information Technology Professionals Association
02. Dasun Sameera Weerasinghe - Senior software Engineer,
03. Nuwan Gamage - software Engineer
04. Tharindu Wickramasinghe - Software Engineer
05. Janaka Konara - Senior QA Engineer
06. Asanka De Silva - Senior Software Engineer and secretary at UNITE
07. Dilip Kumar Fernando - Scientist
08. Harshana Wijayawardana - Senior software Engineer
09. Shakthi Weerasinghe -Senior Project Manager
10. Upul S. Gamage - Senior Project Manager,Senior Business Analyst, eCommerce consultant
11. Dayal Fernando - Senior software Engineer, IOT consultant
12. Manoj Kumara - Senior Network Engineer

# පුළුල් මහජන පෙරමුණක්

සකස් කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් කෙතරම් දියුණු වුවද එම ප්‍රතිපත්තීන් සහ ක්‍රියාකාරී සැලසුම් කැපවී ක්‍රියාවට නංවන රාජ්‍ය පාලනයක් නොමැති නම් එහි ප්‍රතිඵල මහජනතාවට අත්පත් කර දිය නොහැකිය. අනෙක් අතින් සමාජය තීරණාත්මකව වෙනසක් කිරීම යනු දේශපාලනික ක්‍රියාවලියකි. එය එක් කණ්ඩායමකට පුද්ගල සාමුහිකයකට හෝ යම් දේශපාලන පක්ෂයකට පමණක් ඉටු කළ හැකි කාර්යයක් නොවේ. එම නිසා සමාජය වෙනස් කළ යුතු යැයි සිතන, එය වෙනස් කළ හැකියයි විශ්වාස කරන සියලු ප්‍රගතිශීලී දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, බුද්ධිමතුන්, කලාකරුවන්, සමාජ ක්‍රියාකාරිකයන් ඇතුලු සියලු සමාජ පුරවැසියන් ඇතුළත් පුළුල් මහජන පෙරමුණක් බිහිවිය යුතු බව අපගේ විශ්වාසයයි. ජාතික විද්වත් සංවිධානය ලෙස අපි එම පුළුල් මහජන ව්‍යාපාරය බිහිකරලීම සඳහා සියලු සමාජ බලවේගයන්ට ආරාධනා කරමින් තීරණාත්මක මැදිහත් වීමක් සිදු කිරීමට සූදානම් බව මෙහිලා සඳහන් කරමු. මේ වනවිට එහි මූලික කටයුතු ආරම්භ කරනු ලැබ ඇත. සැබෑ මහජන පෙරමුණක් බවට පත්කරලීමට නම් අප ප්‍රතිපත්ති සහ අරමුණ පිළිගන්නා ඒ වෙනුවෙන් කැප වී ක්‍රියා කිරීමට සූදානම් වෙනත් දේශපාලන පක්ෂ සිවිල් සංවිධාන මෙන්ම ප්‍රගතිශීලී සමාජ පුරවැසියන්ටද මෙම මහජන පෙරමුණ තුළ ක්‍රියාත්මක වීම සඳහා අවකාශය තිබිය යුතු බව අපගේ විශ්වාසයයි. එවන්



බලවේග ඒකරාශී කිරීම සඳහා අවශ්‍ය වන කේන්ද්‍රීය මැදිහත්වීම ඉටු කිරීම සඳහා ජාතික විද්වත් සංවිධානය කටයුතු කරනු ඇත. එමෙන්ම වසර 70කට වැඩි කාලයක් මේ රට පාලනය කළ පක්ෂ විසින් ක්‍රියාත්මක කළ දේශපාලන සහ ආර්ථික උපායමාර්ග විසින් රට මෙම තත්වයට පත්කොට ඇති බැවින් එම පක්ෂවල නායකයන් එම අනර්ථකාරී ප්‍රතිපත්ති තීරණාත්මකව ප්‍රතික්ෂේප කොට ප්‍රගතිශීලි කර්තව්‍යයකට දායක වේ යයි විශ්වාස කළ නොහැක. එහෙත් එම පක්ෂවලට එකතු වී ක්‍රියා කරන රටට ආදරය කරන ඇතැම් සාමාජිකයින් සහ හිතවතුන්ට අප බලාපොරොත්තු වන මහජන පෙරමුණ තුළ ක්‍රියාකාරීවීමට  බාධාවක් නොමැති විය යුතු බව අපගේ විශ්වාසයයි.

## ජාතික විද්වත් සංවිධානයේ ව්‍යුහය

### ජාතික විධායක සභාව

ජාතික විද්වත් සංවිධානයේ විධායක සභාවේ සංයුතිය පහත දැක්වෙන පරිදිවේ.

සභාපති ප්‍රධාන ලේකම් සහ ජාතික සංවිධායක

පහත දැක්වෙන කමිටුවල ලේකම්වරු සහ සාමාජිකයෝ ද ජාතික විධායක සභාවට  ඇතුළත් වෙති.

1 පරිපාලන සහ මෙහෙයුම් කමිටුව
2 නීති කමිටුව
3 මාධ්‍ය හා ප්‍රචාරණ කමිටුව
4 අධ්‍යාපන කමිටුව
5 සාමාජික ප්‍රවර්ධන කමිටුව
6 පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව
7 ප්‍රතිපත්ති හා සැලසුම් කමිටුව
8 මුල්‍ය හා විගණන කමිටුව
9 උපාය මාර්ගික සම්බන්ධතා කමිටුව
10 විදෙස් සංවිධාන හා සාමාජිකත්ව සම්බන්ධිකරණ කමිටුව

### ජාතික නියෝජිත මණ්ඩලය

ජාතික විධායක සභාවේ සියලු සාමාජිකයින් සහ ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විධායක සභාවේ සභාපතිවරුන් සහ සම්බන්ධීකාරකවරුන් ඇතුළත්ව ජාතික නියෝජිත මණ්ඩලය සකස් වී ඇත.

### දිස්ත්‍රික් විද්වත් සංවිධාන

ඒ ඒ දිස්ත්‍රික් ජාතික විද්වත් සංවිධානයේ විධායක කමිටුවවල සංයුතිය පහත දැක්වෙන පරිදි වේ.

### සභාපති සහ ප්‍රධාන ලේකම්

පහත දැක්වෙන කමිටුවල ලේකම්වරු සහ සාමාජිකයෝ දිස්ත්‍රික් විධායක සභාවට ඇතුළත් වෙති.

1 පරිපාලන සහ මෙහෙයුම් කමිටුව
2 මාධ්‍ය හා ප්‍රචාරණ කමිටුව
3 අධ්‍යාපන කමිටුව
4 සාමාජික ප්‍රවර්ධන කමිටුව
5 මුල්‍ය හා විගණන කමිටුව

එක් එක් දිස්ත්‍රික්කවලට අයත් මැතිවරණ කොට්ඨාශයන්හි පිහිටුවා ඇති විද්වත් සංවිධානයේ කොට්ඨාශ කමිටු පහත සංයුතියෙන් යුක්ත වේ.

## සභාපති සහ ප්‍රධාන ලේකම්

1 මාධ්‍ය හා ප්‍රචාරණ කමිටුව

2 සාමාජික ප්‍රවර්ධන කමිටුව

3 මුල්‍ය හා විගණන කමිටුව

## ජාතික විද්වත් සංවිධානය සමග සම්බන්ධවීම

කාර්යාලීය ලිපිනය : අංක 33, ශ්‍රී සුභූතිපුර මාවත, බත්තරමුල්ල

දුරකථන අංක : 0112 885686, 0777 199524, 0714 458399, 0718 449424

ෆැක්ස් : 0112 885686

විද්‍යුත් ලිපිනය : info@niosrilanka.org

වෙබ් අඩවිය : www.nio.lk

ජාතික විද්වත් සංවිධානයේ වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ පහත දුරකථන අංක ඇමතීමෙන් අයදුම්පත් ලබා ගත හැකිය. විධිමත්ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිස්ත්‍රික් නියෝජිතයන්ට හෝ ප්‍රධාන කාර්යාලයට බාර දෙන්න. සාමාජිකත්වය පිරිනැමීම ඒ ඒ දිස්ත්‍රික්කවල විධායක සභාවේ නිර්දේශය මත ජාතික විධායක සභාව මගින් සිදු කෙරේ.

සමාජ ආර්ථික හා දේශපාලනයේ ව්‍යුහාත්මක වෙනසක් මගින් ජාතික ආර්ථිකයට ඵලදායී ලෙස දායක වන ආචාරධාර්මික පුරවැසියෙක් බිහි කිරීම සඳහා ජාතික විද්වත් සංවිධානය කේන්ද්‍ර කරගනිමින් ඇති කරන පුළුල් මහජන පෙරමුණ වෙත එක්වන ලෙස අපි ඔබට ආරාධනා කරමු.



**සභාපති :** මහාචාර්ය චන්දන අබේරත්න **0718 716 387**

**ලේකම් :** විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතා **0777 199 524**

**ජාතික සංවිධායක :** ආචාර්ය අනුර කරුණාතිලක **0714 458 399**

# ජාතික විද්වත් සංවිධානය
# தேசிய புத்திஜீவிகள் அமைப்பு
# National Intellectuals Organization


No 33, Sri Subhuthipura Mawatha, Battaramulla, Sri Lanka.
**Tel**: 0112885686, 0777 199524, 0714458399, 0718449424
**Fax**: 0112885686
**eMail**: info@niosrilanka.org
**Web**: www.nio.lk